# ඡායා රූ පිලිසඳර

2011 ඔක්තෝබර් /නොවැම්බර්

**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය**

**Educational and News Bulletin of The National Photographic Art Soceity of Sri Lanka**



**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය, තැ.පෙ. 452, කොළඹ.**


## 2012 නවකයින් බඳවා ගැනීම ඇරඹේ

ඉදිරි වර්ෂය සඳහා නව සාමාජිකයින් බඳවා ගැනීම දැන් ආරම්භ කොට තිබේ. සංගමය සමඟ එක් වීමට පුල පුලා බලා සිටින ඔබේ හිතවතුන්ට සාමාජික අයදුම්පත් ලබා දී දෙසැම්බර් 20වන දිනට පෙර ඒවා සම්පූර්ණකර යලි සංගමය වෙත යොමු කරන්න. අවශ්‍ය සාමාජික අයදුම්පත් සඳහා ලේඛකාධිකාරි ප්‍රවේශ හෝ ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු අමතන්න. තැපැල් මගින් අයඳුම්පත් ගෙන්වා ගැනීම පිණිස, ලේඛකාධිකාරි (ප්‍රවේශ), 260, වෙන්නවත්ත, වැල්ලම්පිටිය යන ලිපිනයට 9 X 4 ප්‍රමාණයේ නම සහ ලිපිනය ලියූ මුද්දර කවරයක් යොමු කරන්න.

නවක සාමාජිකයින් සීමා සහිත පිරිසක් පමණක් බඳවා ගන්නා හෙයින් ඔබේ හිතවතුන්, ඔබගේ වගකීම යටතේ සංගමය වෙත යොමු කරවන්න. අදාල සම්මුඛ පරීක්ෂණ ජනවාරී මස අවසන් දෙසතිය තුළ පැවැත්වෙන අතර නව වසරේ ඡායාරූප පාඨමාලා ආරම්භය පෙබරවාරි මස මුල් සතියේ සිදු කිරීමට නියමිතය.

## වාර්ෂික ඡායාරූප ශිල්ප පරීක්ෂණය ජනවාරි 22 දා

2011 අධ්‍යයන වර්ෂය සඳහා නියමිත 49 වන වාර්ෂික ඡායාරූප ශිල්ප පරීක්ෂණය ජනවාරි 22 වන ඉරුදින කොළඹ සහ කුරුණෑගල දී පැවැත්වීමට නියමිතය. විභාග අයදුම්පත් නිකුත් කිරීම දැන් ආරම්භ කොට ඇති අතර අයදුම්පත් භාරගන්නා අවසන් දිනය දෙසැ 31 වේ. ඉරු දින ඡායාරූප පංති වලදී විභාග අයදුම්පත් ලබාගත හැකි අතර මේ සම්බන්ධ වැඩි විස්තර හා උපදෙස් ගරු අධ්‍යක්ෂක හසිත ලියනගේ 071-8839314 මහතා ඇමතීමෙන් ලබාගත හැකිය.

## 38 වන වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනය හා තරගය 2011 (කෘතීන් භාරගැනීම දීර්ඝ කළා)

සංගමය මගින් පවත්වන්නට යෙදෙන වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනය හා තරගයට ඡායාරූප ඉදිරිපත් කරන ලෙස ඔබ සැමට ගෞරවයෙන් යුතුව ආරාධනා කෙරේ.

කෘතින් භාරගන්නා අවසන් දිනය 2011 නොවැම්බර් මස 20 දිනට දීර්ඝ කරන ලද අතර දෙසැම්බර් මස 16,17 හා 18 දිනවල කොළඹ 07, ජාතික කලා භවනේ දී ප්‍රදර්ශනය පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇත. මේ සඳහා දැන්වීම් හෝ වෙනත් අයුරකින් සම්බන්ධ වී ප්‍රදර්ශනය සාර්ථක කරගැනීමට. ඉදිරිපත් වන ලෙස ඔබට ගෞරවයෙන් යුතුව මතක් කරන අතර සම්පත් පීරිස් මහතා 031 2221444/077 7399256 අමතන්න.

## වාර්ෂික දෙදින චාරිකාව හැටන් ප්‍රදේශයට

සංගමයේ සාමාජික සාමාජිකාවන් සඳහා වන වාර්ෂික චාරිකාව 2012 ජනවාරි මස 7 සහ 8 දෙදිනට යෙදී ඇත. මෙවර සීත කඳුකරයේ සුන්දරත්වය සහ සාමාන්‍ය ජන ජීවිතයේ ඇති විවිධ කෝණවල චමත්කාරය දැකගැනීමේ අරමුණින් හැටන් නගරය සහ ඒ ආශ්‍රිත ප්‍රදේශ තෝරාගෙන ඇත.

ඒ පිළිබඳව සොයාබැලීමේ කටයුතු මේවන විට සිදුවෙමින් පවතියි. සියලුම විස්තර ලබන පිලිසඳර කලාපයෙන් දැනුවත් කිරීමට බලාපොරොත්තු වන අතර සියලු විමසීම් මෙහෙයුම් ප්‍රධාන, තුෂාරගෙන් 0773694094 හෝ දිනේෂ් 0714286254 ගෙන් දැනගන්න.

# සමාජසේවා හා සුබසාධන
## ''ඇයි හොඳයි'' සුහද හමුව

සංගමයේ පැරණි, අලුත්, වැඩිහිටි, බාල සියලු නෑදෑයින්ගේ ඇයි හොඳයි කම් පැවැත්වීමේ දවස පෙබරවාරි 18 සෙනසුරාදාට ලැස්ති කරන්නයි බැලුවේ. එදාට අපි නෑදෑකම් පවත්වන හැටි ලබන වංගියේ පිළිසඳරෙන් කියන්නම්. යමක් දැගන්න මේ නොම්බර වලට කතා කර බලන්ට.
0777187284 නෙරන්ජන්, 0714286254 දිනේෂ්

## නව සත්කාරය

ශ්‍රී ලංකා ජාතික ජායාරූප කලා සංගමයේ පන්ති පැවැත්වෙන මහාබෝධි විද්‍යාලයට සත්කාරයක් හැටියට නව බුදු මැදුර අවට තාප්පයේ සිතුවම් ඇඳීම සිදුකෙරේ. ශ්‍රම සම්පත් හා අමුද්‍රව්‍ය අප විසින් සපයා ගත යුතුව ඇත. පිනට කැමති සාමාජික සාමාජිකාවන් ඒ සඳහා මුදලින් හා අමුද්‍රව්‍යවලින් හෝ ශ්‍රමයෙන් දායක විය හැකි ය. චිත්‍ර ඇඳීමට දක්ෂතාවය ඇති සාමාජික සාමාජිකාවන්ට විශේෂයි. මේ ගැන විමසීමට, සඳුන්: -0777 334331, දිනේෂ්: 071 4286254, රාජු: 077 6099877.

සමාජසේවා හා සුබ සාධන අංශය මගින් පවත්වන්නට යෙදෙන කටයුතුවලට සියලු සාමාජික සාමාජිකාවන් ගේ සහභාගීත්වය ගෞරවයෙන් අපේක්ෂා කෙරේ. මෙම කටයුතු සඳහා ආයාසයකින් තොරව ස්ව කැමැත්තෙන් සහභාගී වීම අප සංගමයේ ආවේණික ගුණයක් යැයි අපි විශ්වාස කරමු. ප්‍රියන්ත අබේසුන්දරඃ අධ්‍යක්ෂ සමාජසේවා හා සුභ සාධනඃ 0777 416669

---

# සාමාජික ජයග්‍රහණ
## හෙන්රි රාජකරුණා මහතා EFIAP දිනා ගනී

අප සංගමයේ ජ්‍යෝෂ්ඨතම ජායාරූප ශිල්පියකු හා ආචාර්යවරයෙකු වන හෙන්රි රාජකරුණා මහතා ජාත්‍යන්තර ජායාරූප කලා සම්මේලනය විසින් ප්‍රදානය කරන EFIAP සම්මානය දිනා ගනු ලැබ ඇත. ඔහු ලංකාව තුළ මෙම සම්මානය ලැබූ හතරවන ඡායාරූප කලාවේදියා වන අතර, සංගමයේ උණුසුම් සුබ පැතුම් ඔහුට පිරිනමමු.

## චන්ද්‍රසේන පෙරේරා හා යමුනී රශ්මිකා පෙරේරා AFIAP සම්මානයෙන් පිදුම් ලබයි

සංගමයේ ජ්‍යෝෂ්ඨ සාමාජික චන්ද්‍රසේන පෙරේරා මහතා හා ජ්‍යෝෂ්ඨ සාමාජිකා හිටපු ප්‍රභාලේඛිකා සංසදයේ සභාපතිනී යමුනී රශ්මිකා පෙරේරා මහත්මිය AFIAP සම්මානයෙන් පිදුම් ලබයි. ඔවුන් දෙදෙනා පිළිවෙලින් 14 වන හා 15 වන AFIAP සම්මාන ලාභීන් වන අතර ඔවුනට සංගමයේ සුබ පැතුම් මෙයින් පිරිනමමු.

## සංගමයේ සාමාජිකයින්ට ජයග්‍රහණ රැසක්

සංගමයේ වත්මන් ප්‍රකාශන අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරන කේ. ජී. කීර්තිරත්න මහතා ශ්‍රී ලංකා ජායාරූප සංගමය මගින් පැවැත්වූ 58වන ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනයේ, වර්ණ විවෘත අංශයේ ප්‍රථම ස්ථානය වන PSA රන් පදක්කමක් දිනා ඇත. එම අංශයෙන්ම සංගමයේ තෙවන වසර සාමාජික ප්‍රේමසිරි හිදැල්ල ආරච්චි මහතාට ද කුසලතා සහතිකයක් හිමිව ඇත. එමෙන්ම සංගමයේ ජ්‍යෂ්ඨ සාමාජික චන්ද්‍රසේන පෙරේරා මහතාට ලෝකඩ පදක්කමක් ද හිමි ව ඇති අතර, දිනේෂ් චන්ද්‍ර කුමාර, උදය සමරතුංග යන අයට ද කුසලතා සහතිකපත් හිමිව ඇත. මෙයට අමතරව සාමාජිකයන් රැසකගේ ඡායාරූප ප්‍රදර්ශනය සඳහා තේරී ඇත. ඔවුනට සංගමයේ සුබ පැතුම් මෙසේ පිරිනමමු.

## අමල් රණවකට රන් පදක්කමක්

කැලණිය විශ්වවිද්‍යාලයේ ඡායාරූප ශිල්ප එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ 2010 කණ්ඩායමේ ප්‍රතිඵල පසුගිය දා නිකුත් විය. විශිෂ්ට සම්මාන සාමාර්ථයයක් සහිතව එහි ප්‍රථමස්ථානය ලැබූ අප සාමාජික අමල් රණවකට ඒ සඳහා නියමිත විල්සන් හැගොඩ රන් පදක්කම පිරිනමනු ලැබිණි. සංගමයේ සුබ පැතුම් ඔහුට පිරිනමමු.

## දී.ග. සෝමපාල මහතා ගෞරව සම්මානයෙන් පිදුම් ලබයි

සංගමයේ ගරු සාමාජික හා ආචාර්යයවරයෙකු වන සම්මානනීය ජායාරූප ශිල්පී හා සිනමා, ටෙලිනාට්‍ය අධ්‍යක්ෂක. රංගන ශිල්පී දී.ග සෝමපාල මහතා 2011 වසර වෙනුවෙන් සෝලියස් මැන්ඩිස් ගෞරව සම්මානයෙන් පිදුම් ලැබුවේය. සමස්ථ ලංකා බෞද්ධ සම්මේලනයේ, බී. එච්. විලියම් ශාලාවේ 2600 වන සම්බුද්ධ ජයන්ති සාහිත්‍ය සම්මාන උළෙලේ දී ඒ මහතාට මෙම සම්මානය හිමි වූ අතර මෙය ජීවිතයේ එක් වරක් පමණක් පිරිනමනු ලබන සම්මානයකි. ඒ මහතාට සංගමයේ සුභාශිංසනය මෙසේ පිළිගන්වමු.

## Montage කිරිබත්ගොඩ දී විවෘත වේ

අප සංගමයේ සාමාජික කලා අධ්‍යක්ෂක වරයෙකු හා ප්‍රවීණ මංගල ජායාරූප ශිල්පියකු වන කුමාර දහනායක මහතා ගේ නව ව්‍යාපාරික ස්ථානය 'Montage' නමින් 186/2, නුවර පාර, කිරිබත්ගොඩ යන ස්ථානයේ දී ජූලි මස 15 දින ආරම්භ විය. ඔහුට සංගමයේ සුභපැතුම්.

---

## කඳුරට ජායාරූප සංගමය යළි බල ගැන්වේ

1969 දී ශ්‍රී ලංකා ජාතික ජායාරූප කලා සංගමය අනුබද්ධව ඩී. ජී. රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් පිහිටවූ කඳුරට ජායාරූප සංගමය වසර කීපයක නිහඬතාවකින් පසු යළි වැඩ ආරම්භ කොට ඇත. මේ දිනවල සාමාජිකයින් සඳහා ජායාරූප පංති පාසල් සඳහා ජායාරූප සම්මන්ත්‍රණ ආදිය සංවිධානය කරමින් සිටින කඳුරට සංගමය මේ සමග සාමාජික ජායාරූප ප්‍රදර්ශනයක් ද පැවැත්වීමට බලාපොරොත්තු වේ. මෙහි පළමු පියවර ලෙස 2011 නොවැම්බර් 12 දින වාර්ෂික මහා සභා රැස්වීම සහ 13 දින ඩිජිටල් ඡායාරූපකරණ වැඩමුළුවක් පවත්වන ලදී.


පිළිසඳරට **වෙහෙස මහන්සිය**
ප්‍රකාශන අධ්‍යක්ෂ කේ.ජී. කීර්තිරත්න
ශාන්ත ගුණරත්න
නාරද අමරතුංග
සුනිල් ලියනගේ

# ශ්‍රී ලාංකීය ජායාරූප වංශය
## 60 වන සංවත්සර පර්යේෂණ ග්‍රන්ථය

අප සංගමයේ 60 වන සංවත්සරය නිමිත්තෙන් නිකුත් කිරීමට අපේක්ෂා කළ පර්යේෂණ ග්‍රන්ථය නොවැළැක්විය හැකි හේතු මත ප්‍රමාද වූ නමුත් එය තව නොබෝ දිනකින් නිකුත් කිරීමට හැකියාව ලැබී ඇති බව සතුටින් දන්වා සිටිමු.

ලක්දිව ජායාරූප ශිල්පය ආරම්භයේ පටන් නිදහසින් පසු වකවානුව තෙක් ජායාරූප ශිල්පයේ විකාශනය සම්බන්ධ සියලු තතු මෙම ග්‍රන්ථයට ඇතුළත් ය. එවක ජායාරූප ශිල්පීන්, ජායාරූප ශිල්ප ආයතන විදේශීය ලේඛකයින්ගේ ලංකාව පිළිබඳ ප්‍රකාශ, ජායාරූප තැපැල්පත්, ලක්දිව වාර්තා චිත්‍රපටකරණයේ ආරම්භය, ලංකාවේ ජායාරූප සහිතව පළකෙරුණු විදෙස් ප්‍රකාශන ඇතුළු තොරතුරු සමුදායක් මෙහි අඩංගු වේ. පශ්චාත් උපාධි ප්‍රදානයක් සඳහා සුදුසු පරිපූර්ණ ශාස්ත්‍රීය කෘතියක් වශයෙන් ද පිළිගනු ලැබ ඇති මෙය සංගමයේ හිටපු සභාපති උදිත ගයාෂාන් ගුණසේකර මහතා විසින් සම්පාදනය කරනු ලැබූවකි.

වර්ණ සහ ඒක වර්ණ ජායාරූප දෙසිය පනහකට අධික සංඛ්‍යාවකින් සමන්විත මෙය ඔප කඩදාසියේ මුද්‍රිත පිටු තුන්සීයකට ආසන්න ගණනකින් සමන්විත වේ. පුස්තකාල මුද්‍රණ තත්වයෙන් යුතුව ඉතා සීමිත පිටපත් සංඛ්‍යාවක් (Limited Edition) පමණක් මුද්‍රණය කෙරෙන හෙයින් ඔබට අවශ්‍ය පිටපත් කල් තබා වෙන් කරවාගත යුතුවේ. ඇණවුම් සඳහා පමණක් සංගමයේ සාමාජිකයනට ලබාදිය හැකි අතර රු.1200.00 කට මිල නියම කොට ඇති මෙය සාමාජිකයින් සඳහා විශේෂ වට්ටමක් යටතේ රු.1000.00 කට ලබා දීමට විධිවිධාන යොදා ඇත.

ශ්‍රී ලාංකීය ජායාරූප වංශයෙහි යථා තත්වය දැනගැන්මට ලාංකීය ජායාරූප කලාවේදියෙකු වශයෙන් ඔබට ද අවශ්‍ය නම්, පහත සඳහන් කූපනය පුරවා මුදල් ද සමග ගරු ප්‍රකාශන අධ්‍යක්ෂ කේ. ජී. කීර්තිරත්න මහතා වෙත නොපමාව භාර දෙන්න. වැඩි විස්තර සඳහා ඒ මහතාගේ 071-4458144 දුරකථන අංකයෙන් ලබාගත හැකිය.

**<u>ශ්‍රී ලාංකේය ජායාරූප වංශය</u>**

ශ්‍රී ලංකා ජාතික ජායාරූප කලා සංගමයේ 60 වන සංවත්සර පර්යේෂණ ග්‍රන්ථය

උක්ත ග්‍රන්ථයේ පිටපතක් මා නමින් වෙන්කරන මෙන් ඉල්ලමි. රු. 1000/= මුදල මේ සමග ඉදිරිපත් කරමි.

සාමාජිකයාගේ නම : ..........................................................................

සාමාජික අංකය : ..........................................................................

ලිපිනය : ..........................................................................

..........................................................................

දුරකථන අංක : ..........................................................................

---

## 'අව්රෝරා'- සහ 'නමක් නැති මිනිහෙක්'

සාමාජික ගාමිණී බස්නායක මහතා 'අව්රෝරා' නමින් කාව්‍ය සංග්‍රහයක් සහ 'නමක් නැති මිනිසෙක්' වේදිකා නාට්‍ය පිටපත මුද්‍රණද්වාරයෙන් නිකුත් කළේය. ජායාරූප කලාවේදියකු මෙන් ම නාට්‍ය හා රංග කලා විද්‍යාර්ථයෙකු ද නව පරපුරේ කවියකු ද වන ඒ මහතා සිය කෘති මගින් බොහෝ දෙනා එළිපිට කතා නොකරන යථාර්ථවත් මානව හැඟීම් හා අභිලාෂයන් නිර්මාණාත්මක ලෙස අප වෙත ඉදිරිපත් කරයි. මීට පෙර නිකුත් කළ 'මදු මල් සුවඳ' කෙටිකතා සංග්‍රහය ඔහුගේ පළමු කෘතියයි. මෙම කෘති කතුවරයා වෙතින් ලබා ගත හැකි ය.
දුරකථනය- 071-6015434

## 'සෙල් පිළිම වත' දෙවන මුද්‍රණය නිකුත් වේ

සාමාජික මංජුල කරුණාදාස මහතා විසින් සම්පාදිත සෙල් පිළිම වත කෘතියේ දෙවන මුද්‍රණය නොබෝදා දොරට වැඩියේය. රම්බඩගල්ල-, මොණරාගල විහාරයේ නව ශෛලමය සමාධි ප්‍රතිමාව පිළිබඳව රචනා කරන ලද මෙය වෛවර්ණ පිටු 44 කින් යුතු කෘතියකි. මේ පිළිබඳ තොරතුරු සඳහා 037-3375401 අංකයෙන් කරුණාදාස මහතා ඇමතිය හැකි ය.

## 'අටවක' දෙවන පියවර

කැලණිය විශ්ව විද්‍යාලයේ ප්‍රතිබිම්බ කලා ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය හදාරන විද්‍යාර්ථීන් කණ්ඩායමක් විසින් පසුගිය දා විශ්ව විද්‍යාලයේදී පවත්වන ලද 'අටවක' ජායාරූප ප්‍රදර්ශනය දෙවන වරට 2011 නොවැම්බර් මස 25 සිට සතියක් පුරා මහනුවර Alliance Francaise ප්‍රදර්ශන ශාලාවේ දී පැවැත්වේ. මෙම විද්‍යාර්ථීන් අතර අමන්දා ජයවර්ධන, අරවින්ද චන්ද්‍රපද්ම, පබසරා රණසිංහ, සම්පත් දර්ශන, ප්‍රසාද් අලුත්වත්ත, චානුක තියඹරාවත්ත, නාලක සංජීව සහ ප්‍රෞඪ බුවනෙක යන අප සාමාජික සාමාජිකාවෝ සිය කෘති ඉදිරිපත් කරති.

## සුදත් මහදිවුල්වැවට සිග්නීස් සම්මාන 4ක්

සුදත් මහදිවුල්වැව මෙරට තරුණ පරපුරේ නිර්මාණශීලී සිනමා සහ ටෙලි නාට්‍ය අධ්‍යක්ෂවරයෙකි. පසුගිය ඔක්තෝබර් මස පවත්වනු ලැබූ සිග්නීස් සම්මාන උළෙලේ දී ඔහුගේ නිර්මාණ 4 ක් සම්මානයට පාත්‍රවිය.

මෙහි දී සුනාමියෙන් අසාධාරණයට ලක්වූ ජනතාව කේන්ද්‍ර කරගනිමින් අධිකරණ අමාත්‍යාංශයේ සමාජ සත්කාරක ව්‍යාපෘතියක් වෙනුවෙන් නිර්මාණය කරන ලද 'වැල්ලට දෙවියො ඇවිත්' යන පර්යේෂණාත්මක වාර්තා නිර්මාණය සඳහා වසරේ හොඳ ම වාර්තා නිර්මාණය වෙනුවෙන් ද,

ඩයලොග් දුරකථන සමාගම වෙනුවෙන් නිර්මාණය කරන ලද අවුරුද්දට ගමේ ඇවිත් යන වෙළඳ නිර්මාණය සඳහා හොඳම වෙළඳ නිර්මාණය වෙනුවෙන් ද,

ජාතික උරුමයක් වූ මාදු ගඟේ සිදුවෙමින් පවතින පරිසර හානිය සම්බන්ධව ධීවර සහ වෙරළ සංරක්ෂණ අමාත්‍යාංශයේ ජනතාව (සමාජය) දැනුවත් කිරීම උදෙසා කරණු ලැබූ 'මාදු ගඟ' නම් වූ වාර්තා නිර්මාණය උදෙසා විශේෂ සම්මානය ද,

පශ්චාත් යුද සමය තේමා කරගනිමින් සුදත් විසින් නිර්මාණය කරන ලද 'Baton Change' (යෂ්ඨි හුවමාරුව) නම් වූ කෙටි සිනමා චිත්‍රපටය උදෙසා විශේෂ සම්මානය ද ඔහු විසින් දිනා ගන්නා ලද සම්මාන හතර වේ. ඒ පිළිබඳව ඔහුට සංගමයේ සුභපැතුම් පිරිනමමු.

## සාමාජිකත්වය රැකගනිමු

දෙවසරකට වැඩි කලක් සාමාජික මුදල් නොගෙවූ සියලු දෙනාගේ සාමාජිකත්වය අහෝසි කිරීමට සිදුවේ. එබැවින් ඔබගේ හිඟ සාමාජික මුදල් වේ නම් එය පියවා සාමාජික වරප්‍රසාද රැක ගැනීමට කඩිනමින් ක්‍රියාත්මක වන මෙන් මෙයින් ඉල්ලා සිටිමු. එහෙයින් හිඟ සාමාජික මුදල් වේ නම් මුදලින්, චෙක්පතකින් හෝ ඉරු දින සවස මහාබෝධි විද්‍යාලයට පැමිණීමෙන් ද එය ගෙවිය හැකි ය. මේ පිළිබඳ විමසුමක් වෙතොත් මුදල් අනු කමිටු ප්‍රධානී සුනිල් ලියනගේ (077-0494150) මහතා අමතන්න.

# සාමාජික ප්‍රදර්ශන

## Captured Moments

අප සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු වන චන්ද්‍රසේන පෙරේරා මහතාගේ තුන්වන ඒක පුද්ගල ජායාරූප ප්‍රදර්ශනය 2011 අගෝස්තු මස 26, 27 හා 28 දිනවල ලයනල් වෙන්ට් කලාගාරයේ හැරල් පීරිස් ශාලාවේ දී පැවැත්විණි. ජායාරූප ශිල්පයට පමණක් නොව සිනමාව, නවකතාව, කෙටිකතාව යන කලාවන්ට ද ඔහු සම්බන්ධ වී ඇත. 'බිත්ති හතර' චිත්‍රපටයේ තිර රචනයෙන් ද, සහාය අධ්‍යක්‍ෂවරයා වශයෙන් ද කටයුතු කර ඇති ඔහු මාලිනී ෆොන්සේකා රඟපෑ තුත්තිරිමල් චිත්‍රපටයේ කතාව, තිරරචනය සහ සහාය අධ්‍යක්‍ෂණයෙන් ද දායක වී ඇත. ඔහු අධ්‍යක්‍ෂණය කළ 'දයාබර දරුවෙක්' කෙටි චිත්‍රපටයට 1982 දී හොඳම කෙටි චිත්‍රපටයට හිමි ඕ. සී. අයි. සී. සම්මානය හිමි වූයේය.

## 'Transcend' ජායාරූප ප්‍රදර්ශනය

සංගමයේ ප්‍රකාශන අධ්‍යක්‍ෂ කේ. ජී. කීර්තිතරත්න මහතාගේ දෙවන ඒක පුද්ගල ජායාරූප ප්‍රදර්ශනය ඔක්තෝම්බර් 14 වැනි දින පස්වරුවේ කොළඹ ජේ. ඩී. ඒ. පෙරේරා කලාගාරයේ දී සම්භාවනීය, සම්මානනීය සිනමාවේදිනී ආචාර්ය මාලිනී ෆොන්සේකා මැතිණිය අතින් විවෘත විය. ඩිජිටල් තාක්‍ෂණයේ මහිමයෙන් යථාර්ථය නිර්මාණශීලී ලෙස ඉදිරිපත් කිරීම උදෙසා නිර්මාණය වූ කෘති 50 ක් මීට ඇතුලත් විය. මෙය සංගමයේ සහාගී සාමාජිකත්ව සම්මානය (FNPAS) සඳහා පවත්වනු ලැබුවකි. කොඩැක්, කැනන්, ලක්සේයා, විස් ආර්ට්, එප්සන් ආයතන මේ සඳහා අනුග්‍රහය දක්වා තිබුණි.

## 'සසල' ජායාරූප ප්‍රදර්ශනය

අප සංගමයේ විද්වත් සාමාජිකයෙකු වන මහාචාර්ය පැට්‍රික් රත්නායක මහතාගේ පළමු ඒක පුද්ගල ජායාරූප ප්‍රදර්ශනය සසල නමින් ඔක්තෝම්බර් 14 වන දින සන්ධ්‍යාවේ කොළඹ ලයනල් වෙන්ට් කලාභවනයේ දී ආරම්භවිය. ජපානයේ සුනාමි ව්‍යසනයෙන් පසු තත්වය විදහාපාන මෙය ජායාරූප සියයකට අධික සංඛ්‍යාවකින් සමන්විත වී තිබුණි. වාර්තා ජායාරූප ප්‍රදර්ශනයක් වූ මෙයට ලක්සේයා, නයින්හාර්ට්ස්, විස් ආර්ට්, GHR එන්ටර්ප්‍රයිසස්, RamaDBK Ltd. යන ආයතනවල අනුග්‍රාහකත්වය ලැබිණි.

## 'Poetic images' ජායාරූප ප්‍රදර්ශනය

සංගමයේ සාමාජික අතුල ප්‍රියංකර දිසානායකගේ-රූප කාව්‍ය (Poetic images) තෙවන ජායාරූප ප්‍රදර්ශනය 2011 මාර්තු මස 24,25,26 හා 27 ලයනල් වෙන්ඩ්ට් කලාගාරයේ දී පැවැත්විනි. මෙහි දී, 'Miraculous Island in the Indian Ocean' නමින් ග්‍රන්ථයක් ද එළිදක්වා ඇත.

## කාච සිත්තම් ජායාරූප ප්‍රදර්ශනය

අප සාමාජික ප්‍රදීප් සඳරුවන් (09/5594) මහතා විසින් පවත්වන ලද ප්‍රථම ඒක පුද්ගල ජායාරූප ප්‍රදර්ශනය පසුගිය මාර්තු 10,11 යන දින වල ගල්ගමුව, මහනාන් එළිය මහ විදුහලේ දී පැවැත්විණි. ගැමි සෞන්දර්යය තේමා කොට ගත් ජායාරූප 30 ක් පමණ ඊට ඇතුළත්ව තිබුණි.

## 'සිත් අසපුව'

ජ්‍යෙෂ්ඨ සාමාජික ඩුලිප් සමරසිංහගේ දෙවන ඒක පුද්ගල ජායාරූප ප්‍රදර්ශනය සිත් අසපුව, ඔක්තෝම්බර් 14,15 හා 16 දිනවල කොළඹ මහජන පුස්තකාල ප්‍රදර්ශන ශාලාවේ දී පැවැත්විණි. නවසීලන්තයේ ජීවත්වන විදේශිකයන්ගේ ආලේඛ්‍ය ප්‍රකාශන මෙම ජායාරූපවලට නිමිති කොටගෙන තිබීම විශේෂයකි. මේ සෑම ජායාරූපයක් ම විවිධ මානව චර්යාවන් හා සංස්කෘතික ලක්‍ෂණ ප්‍රකට කළ කලු සුදු ඒවා විය.

## උපනෙත - 2011

කැලණිය විශ්ව විද්‍යාලයේ ප්‍රතිබිම්බ කලා ශාස්ත්‍රවේදී විශේෂ උපාධි විද්‍යාර්ථීන්ගේ වාර්ෂික ජායාරූප සහ කෙටි චිත්‍රපට ප්‍රදර්ශනය 05,06,07 දිනවල විශ්ව විද්‍යාල ක්‍රීඩාංගනයේ දී පැවැත්විනි. 14 වැනි වරට පැවැත් වූ මෙම උපනෙත ප්‍රදර්ශනය සඳහා දායක වූ නිර්මාණවේදීන් දස දෙනා අතර පහත නම් සඳහන් අප සාමාජික සාමාජිකාවෝද සිය කෘති ඉදිරිපත් කළහ. ඔවුන් වෙත සංගමයේ සුභාශිංසන පිරිනැමේ.

| | |
|---|---|
| විමල් ප්‍රියශාන්ත | දර්ශනී චතුරිකා |
| අචල ප්‍රියංකර | ධනුෂ්ක සේනාරත්න |
| රොෂාන් සචිත් රූපසිංහ | ප්‍රදීප් සඳරුවන් |

## විලෝකන 2011

කැලණි සරසවියේ 2010 කණ්ඩායම් එක් අවුරුදු ජාතික ශිල්ප ඩිප්ලෝමාධාරීන් විසින් සංවිධානය කළ විලෝකන 2011 ජායාරූප දැක්ම ඔක් 27 වැනි දින පස්වරුවේ කෙළඹ ජේ. ඩී.ඒ. පෙරේරා කලාගාරයේ දී විවෘත කෙරිනි. මෙම කණ්ඩායමේ විද්‍යාර්ථීන් අතරින් පහත සඳහන් බහුතර පිරිස අප සංගමයේ සාමාජික සාමාජිකාවෝ වෙති. ඔවුන්ගේ ජායාරූප මෙම ප්‍රදර්ශනයේ දී මහජන දැක්ම සඳහා ඉදිරිපත් කෙරුණු අතර ඊට සැලකිය යුතු රසික ප්‍රතිචාර හිමිවිය. ඔවුන්ට අපේ සුබ පැතුම්.

| | |
|---|---|
| අමල් රණවක | ප්‍රියංකර ගමගේ |
| අතුල රණරාජ | රොහාන් ෆොන්සේකා |
| රෝහිනි වික්‍රමආරච්චි | වෙනුර ද සිල්වා |
| හසිත ධනංජය | උපුල් රුදිගු |
| ලලිත් සමීර | |

## 'Harmony' ජායාරූප ප්‍රදර්ශනය

සාමාජික මහේෂ් චතුරංග විජේසූරිය මහතාගේ පළමු ඒක පුද්ගල ජායාරූප දැක්ම ජුනි 11 සහ 12 දිනවල හෙට්ටිපොල ලක්සිරි සාද නිකේතනයේ දී පැවැත්විණි.

## අපේ ශෝකය...

- සංගමයේ හිටපු අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු වූ ශාන්තිලාල් ප්‍රනාන්දු මහතාගේ දයාබර පියාණන් නොබෝදා අප අතරින් වියෝ විය.
- සංගමයේ ක්‍රියාකාරී ජ්‍යෙෂ්ඨ සාමාජික සමන්ත සේනක බණ්ඩාර මහතාගේ දයාබර පියාණන් වූ ඇඹිලිපිටියේ විසූ ඒ. එම්. වයි. බණ්ඩාර මහතා පසුගිය දා අප අතරින් වියෝවිය.
- අප සංගමයේ සාමාජික හා ප්‍රවීන දේශක ඉන්දුනාථ තේනුවර මහතාගේ මව වන ගනේමුල්ලේ විසූ විමලා තේනුවර මහත්මිය අභාවප්‍රාප්ත වූවාය.
- සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික රාහුල පෙරේරා මහතාගේ දයාබර මාමණ්ඩිය පසුගියදා අභාවප්‍රාප්ත විය.
- සාමාජිකා අමා බුද්ධිනී මුතුකුමාරගේ (සා.අංක 11/5944) ආදරණීය පියාණන් වූ ගුණපාල මුතුකුමාරගේ මහතා පසුගිය දා අභාවප්‍රාප්ත විය.
- කොඩැක් නේවාසික කලමනාකාර ටිරෝන් පෙරේරා මහතාගේ නැන්දනිය පසුගිය දා අභාවප්‍රාප්ත වූවාය.
- සංගමයේ ක්‍රියාකාරී සාමාජික විරාජ් ලියනාරච්චි මහතාගේ දයාබර මාමණ්ඩිය වූ ගරුසිංහගේ ගුණසේකර මහතා පසුගිය දා අප අතරින් වියෝ විය.

එම පවුල් වෙත සංගමයේ ශෝකය මෙසේ පළකරමු.

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
The National Photographic Art Society of Sri Lanka

# නිලධාරී මණ්ඩල වගකීම්

**අරමුණු**

සාමාජිකත්වයේ බහුතර එකඟතාව පරිදි පත්කරගනු ලබන නිල වගකීම් හොබවන අයගෙන් සංගමයේ අභිවෘද්ධිය සඳහා වඩාත් වැඩි දායකත්වයක් ලබාගැනීම මෙයින් අරමුණු කෙරේ.

**නිර්දේශ**

**01. පොදු කොන්දේසි**

1.1. අධ්‍යක්ෂ මණ්ඩලය මෙන් ම ඒ යටතේ පවතින අනු කමිටු ද විශේෂ කමිටු සහ මණ්ඩලවල වගකීම් හොබවන අය ද නිලධාරීන් ලෙස සැලකේ.

1.2. තමන් විසින් භාරගන්නා වගකීම්, සංගමයේ ව්‍යවස්ථාව සහ චක්‍රලේඛ මගින් අර්ථ නිරූපණය කොට ඇති පරිදි ඉටුකරලීමට නිලධාරීහු බැඳී සිටිති.

**02. අධ්‍යක්ෂ මණ්ඩලය**

2.1. වාර්ෂික මහා සභාවේ දී සාමාජිකයින්ගේ තෝරාගැනීම මත වසරක නිල කාලසීමාවක් සඳහා පත්කරගනු ලැබේ.

2.2. අධ්‍යක්ෂ මණ්ඩල ව්‍යුහය ව්‍යවස්ථාවෙන් දක්වා ඇති පරිදි වේ.

2.3. එක් අධ්‍යක්ෂවරයෙකුට එක දිගට එක් තනතුරක රැඳී සිටිය හැකි උපරිම කාලය වසර 03 කි. එහෙත්, මහා සභා ර ස්වීමක ඒකමතික තීරණය සහ අදාළ අධ්‍යක්ෂවරයාගේ කැමැත්ත පරිදි වැඩිපුර එක් වසරක් එකී තනතුරෙහි රැඳී සිටිය හැකි ය.

2.4. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් එකී එක් තනතුරක අඛණ්ඩ ව රැඳිය හැක්කේ වසර 03 ක් වුව ද, තනතුරු වෙනස් වන්නේ නම් අධ්‍යක්ෂ මණ්ඩලය තුළ තවත් වසර 03 ක් බැගින් අභිමත කාලයක් රැඳී සිටිය හැකි ය.

2.5. කිසියම් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුට එරෙහිව සාමාජිකත්වය වෙතින් විරෝධයක් ගොඩනැගෙන්නේ නම් එය, ලිඛිතව අධ්‍යක්ෂ මණ්ඩලය හමුවේ සභාගත කොට විවෘත තීන්දුවක් ගත හැකි ය. එය අදාළ චූදිතයා රහිත ව අධ්‍යක්ෂ මණ්ඩලයේ සෙසු සාමාජිකයින්ගේ ඒකමතික එකඟතාව මත ගනු ලබන තීරණයක් හෝ ඊට අදාළව පත්කරනු ලැබූ විශේෂ කමිටුවක වාර්තාවක් සලකා බලා ගනු ලබන තීරණයක් විය යුතු ය. එවන් අවස්ථාවක චූදිතයා සතු නිල වගකීම් විධායක අධ්‍යක්ෂවරයා වෙත පවරාගත හැකි ය.

2.6. සෑම අධ්‍යක්ෂවරයෙකුට ම තම තනතුරෙහි වගකීම සාර්ථක ලෙස ඉටුකරලීම වෙනුවෙන් අනු කමිටු එකක් හෝ කිහිපයක් පත් කරගත හැකි අතර, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ඒකමතික අනුමැතිය අවශ්‍ය වේ.

2.7. සංගමයේ ලිපි ශීර්ෂවල තම අත්සනින් යුතුව ලිපි නිකුත් කිරීමේ බලය ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට පමණි. එහෙත් අත්‍යවශ්‍ය අවස්ථාවන්හි අධ්‍යක්ෂවරුන්ගේ වගකීම හා අවසරය යටතේ අන් සාමාජිකයෙකුට ලිපි ශීර්ෂයක අත්සන් කළ හැකි ය. එලෙස නිකුත් කෙරෙන සියලු ම ලිපිවල පිටපත් දෙසතියක් ඇතුළත විධායක අධ්‍යක්ෂවරයා වෙත භාරදිය යුතු ය.

2.8. තමන් යටතේ පවතින අනුකමිටු, උපකමිටු හෝ විශේෂ කමිටුවල ක්‍රියාකාරීත්වය පිළිබඳ සම්පූර්ණ වගකීම අදාළ අධ්‍යක්ෂවරයාට පැවරේ.

**03. අනුකමිටු සහ උපකමිටු**

3.1. අනුකමිටු සඳහා සාමාජිකයින් නම් කිරීම සහ එකී නම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීම මගින් අනුකමිටු ප්‍රතිෂ්ඨාපනය ඒ ඒ අධ්‍යක්ෂවරයා සතු වගකීමකි.

3.2. අනුකමිටු සාමාජිකයින් සිය කමිටු භාර අධ්‍යක්ෂවරයාට සෘජු ව ද, එමගින් සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලයට ද වග කිව යුතු ය.

3.3. අනුකමිටුවේ සාමාජිකයෙකුගේ නිල කාලය වසරකි. වසර මැද දී කමිටුවෙන් ඉවත් වුවහොත් හෝ අදාළ අධ්‍යක්ෂවරයා විසින් ඉවත් කරනු ලැබුවහොත් එකී පුරප්පාඩුවට අන් අයෙකු පත් කළ හැකි ය.

3.4. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය යැයි තීරණය කෙරෙන විශේෂ ව්‍යාපෘති සහ අනිකුත් කාර්යයන් සඳහා අනුකමිටු සාමාජිකයින් යටතේ උපකමිටු ද පත් කළ හැකි ය. එකී පත්කිරීම් ද විෂය භාර අධ්‍යක්ෂවරයා විසින් සිදු කළ යුතු අතර, ඒ සඳහා ද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අපේක්ෂා කෙරේ.

**04. විශේෂ කමිටු**

4.1. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන විශේෂ කාර්යයන් සඳහා විශේෂ කමිටු පත් කළ හැකි ය. විශේෂ ව්‍යාපෘති කමිටු, විනය කමිටු යනාදිය ඊට අයත් වේ. මෙම කමිටුවලට ඇතුළත් සාමාජික සංඛ්‍යාව අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය පරිදි තීරණය කෙරේ.

4.2. අදාළ කාර්යය හමාර වූ පසු හෝ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් නියම කරනු ලබන කාල සීමාවක දී එකී විශේෂ කමිටුවල නිල කාලය හමාර වේ.

**05. නිලධාරීන් සතු වරප්‍රසාද සහ ප්‍රතිලාභ**

5.1. අධ්‍යක්ෂ මණ්ඩල හා කමිටු සාමාජික තනතුරු හොබවන සෑම කෙනෙක් ම වැටුප් හෝ දීමනා නොලබන ගරු සේවයක නියැලෙන්නෝ වෙති. ඊට අදාළ ප්‍රණාමය සෑම විට ම ඔවුනට හිමි විය යුතු වේ.

5.2. ඡායාරූප ක්ෂේත්‍රයට අදාළව කරනු ලැබූ සේවාව ඇගැයීමට ලක්කොට පිරිනමනු ලබන සම්මාන සඳහා, නිලධාරීන් ලෙස සංගමයට සේවය කර තිබීම විශේෂයෙන් සලකා බැලිය යුතු කරුණකි.

# මාසික ඡායාරූප තරග ප්‍රතිඵල

## විහාර මහා දේවි උද්‍යාන ඡායාරූප තරගය

**B.P. වීරවර්ධන ශූරතා පළිහ**

**වර්ණ අංශය**

1) H. J. දර්ශිත ෆොන්සේකා
(සමස්ථ ප්‍රථමස්ථානය)
2) M. A. ඉඳුනිල් ජීවන්ත
3) ජයනාත් කුමාර ඉලංගකෝන්
4) ජයනාත් කුමාර ඉලංගකෝන්
5) සුරේෂ් ලසන්ත මුණසිංහ

**කළු සුදු අංශය**

1) ජයනාත් කුමාර ඉලංගකෝන්
(B.P. වීරවර්ධන ශූරතා පළිහ)
2) දිල්ශාන් නයනජිත්
3) J. A. ජයලත් පේමවංශ
4) ජයනාත් කුමාර ඉලංගකෝන්
5) උයද සමරතුංග

**තරග විනිශ්චය :-**
බන්දු ගුණරත්න මහතා.



H. J. දර්ශිත ෆොන්සේකා(වර්ණ සමස්ථ ප්‍රථමස්ථානය)

## කැලණි විහාර ඡායාරූප තරගය

**L. B. B. S. බාලසූරිය ශූරතා පළිහ**


**කළු සුදු අංශය**

1) සුරේෂ් ලසන්ත මුණසිංහ
(L. B. B. S. බාලසූරිය ශූරතා පළිහ)
2) අමිල බටගල්ල
3) දිනේෂ් චන්ද්‍ර කුමාර
4) R. A. නිමාෂා
5) M. A. ඉඳුනිල් ජීවන්ත

**වර්ණ අංශය**

1) අමිල බටගල්ල
2) M. A. ඉඳුනිල් ජීවන්ත
3) චන්දන ලියනගේ
4) W. ප්‍රීති ශමින්ද විජේසිංහ
5) W. ප්‍රීති ශමින්ද විජේසිංහ

**තරග විනිශ්චය:-**
හෙන්රි රාජකරුණා මහතා



සුරේෂ් ලසන්ත මුණසිංහ
L. B. B. S. බාලසූරිය ශූරතා පළිහ



අමිල බටගල්ල
(වර්ණ ප්‍රථම ස්ථානය)

## 2011/09/04 මාසික ඡායාරූප තරගය

**වර්ණ අංශය :-**

1) D. R. N. H. කුමාරසිංහ
(සමස්ථ ප්‍රථම ස්ථානය)
2) R. A. නිමාෂා
3) H. J. දර්ශිත ෆොන්සේකා
4) P. D. දිල්ෂාන් නයනජිත්
5) රොහාන් ද සිල්වා

**කළු සුදු අංශය :-**

1) නලීන් කාරියවසම් (සමස්ථ ප්‍රථම ස්ථානය)
2) L. M. ජයනාත් කුමාර ඉලංගකෝන්
3) R. A. නිමාෂා
4) K. V. සමන් විජය බණ්ඩාර
5) A. S. තුෂාර

**ඇගයීම් කටයුතු** :- G. හෙට්ටිආරච්චි මහතා

**ත්‍යාග සඳහා අනුග්‍රහය**:-
සේයා කලර් වර්ණ රසායනාගාරය, කළුබෝවිල, L. B. S. S. බාලසූරිය මහතා, සුපිරි සම්පත් වර්ණ රසායනාගාරය, ගම්පහ



නලීන් කාරියවසම් (කලු සුදු සමස්ථ ප්‍රථම ස්ථානය)




D. R. N. H. කුමාරසිංහ (වර්ණ සමස්ථ ප්‍රථම ස්ථානය)

## 2011/09/25 සත්වෝද්‍යාන ඡායාරූප තරගය

**විල්සන් හැගොඩ ශූරතා පළිහ:**
H. J. දර්ශිත ෆොන්සේකා

**වර්ණ අංශය :-**

1) K. G. අසන්ත ප්‍රදීප්
2) L. A. I. කරුණාරත්න
3) L. A. I. කරුණාරත්න
4) උදය සමරතුංග
5) H. J. දර්ශිත ෆොන්සේකා




K. G. අසන්ත ප්‍රදීප් (වර්ණ ප්‍රථම ස්ථානය)

**කළු සුදු අංශය :-**

1) H. J. දර්ශිත ෆොන්සේකා
2) ජයනාත් ඉලංගකෝන්
3) ජයනාත් ඉලංගකෝන්
4) K. G. අසන්ත ප්‍රදීප්
5) B. R. L.P. ගුණතිලක

**ඇගයීම් කටයුතු :**
දී.ග. සෝමපාල මහතා, ප්‍රියන්ත අබේසුන්දර මහතා, අතුල රණරාජ මහතා.

**ත්‍යාග සඳහා අනුග්‍රහය :-**
සේයා කලර් වර්ණ රසායනාගාරය, කළුබෝවිල, දෙහිවල
L. B. S. S. බාලසූරිය මහතා, සුපිරි සම්පත් වර්ණ රසායනාගාරය, ගම්පහ



H. J. දර්ශිත ෆොන්සේකා
(විල්සන් හැගොඩ ශූරතා පළිහ)